# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 51 දරන
# තේ (බදු හා අපනයන පාලනය) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 දෙසැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි    තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1985 අංක 51 දරන තේ (බදු හා අපනයන පාලනය) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 27 වන දින.]
එල්. ඩී.—ඕ 53/84.

## 1959 අංක 16 දරන තේ (බදු හා අපනයන පාලනය) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 51 දරන තේ (බදු හා අපනයන පාලනය) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1959 අංක 16 දරන තේ (බදු හා අපනයන පාලනය) පනතේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1959 අංක 16 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(1) තේ අපනයනය කිරීම පිණිස අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතියෙහි විය යුතුය.

(2) තේ අපනයනය කිරීම සඳහා යම් තැනැත්තකු වෙත මේ වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීම—

(අ) ඒ තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා තේ අපනයනකරුවකු ලෙස ලියාපදිංචි වී ඇති බවට;

(ආ) එම තේ—

(i) කොළඹ තේ වෙන්දේසියක දී විකුණනු ලැබ ඇති බවට; හෝ

(ii) අනුමත කරන ලද වත්තක නිෂ්පාදනය කරනු ලැබ—

(අඅ) අනුමත ප්‍රමාණයකින් යුක්ත වන අතර ලන්ඩනයේ තේ වෙන්දේසියක විකිණීම සඳහා අදහස් කර ඇති බවට; හෝ

(අආ) අනුමත ප්‍රමාණයකින් යුක්ත වන අතර මේ උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධානවල විස්තර කර ඇති තේ නොවන, තේ බවට;

(ඇ) එම තේ අපනයනය කිරීම සඳහා සුදුසු තත්ත්වයක පවතින තේ බවට; සහ

(ඈ) එම තැනැත්තා මේ පනතේ විධිවිධාන කිසිවක් කඩකර නොමැති බවට,

කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත් මිස, නොකරනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අළුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) තේ අපනයනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ කොමසාරිස්වරයාගේ තීරණය, ඊට තුඩුදුන් හේතු ද සමග ඉල්ලුම්කරු වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතුය; නැත හොත් එසේ දැනුම් දීමට සලස්වනු ලැබිය යුතුය."; තවද

(3) එම වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(3) ලන්ඩනයේ තේ වෙන්දේසියක විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනු ලබන අවස්ථාවක, එම තේ අපනයනය කිරීමට අවසර දෙන මේ වගන්තිය යටතේ වූ අවසර පත්‍රයෙහි, කොමසාරිස්වරයා විසින්, ඒ බව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තෙකු මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරමින් ක්‍රියා කර ඇතැයි විශ්වාස කිරීමට කොමසාරිස්වරයාට කරුණු ඇති අවස්ථාවක, එවැනි කඩ කිරීමක් සිදුවී තිබේද නැද්ද යන්න ඔහු විසින් තීරණය කරනු ලබන තුරු එම අවසර පත්‍රය කොමසාරිස්වරයා විසින් අත්හිටුවනු ලැබිය හැකි ය.";

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අළුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4අ) අවසර පත්‍රය අත්හිටුවීමට කොමසාරිස්වරයා කළ තීරණය, කොමසාරිස්වරයා විසින්, අවසර පත්‍රධාරියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය; නැතහොත් එසේ දැනුම් දීමට සැලැස්විය යුතු ය.";

(5) එම වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (5) කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් හෝ පවත්වනු ලබන පරීක්ෂණයකින් පසුව, මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩකර ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වේ නම්, ඔහු විසින් එම අවසර පත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය." ;

(6) එම වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (5අ) අවසර පත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට කොමසාරිස්වරයා කළ තීරණය, ඊට තුඩුදුන් හේතු ද සමග, කොමසාරිස්වරයා විසින් අවසරපත්‍රධාරියා වෙත ලියවිල්ලකින් දනුම් දිය යුතු ය ; නැතහොත් දනුම් දීමට සැලැස්විය යුතු ය." ;

(7) එම වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"අවසර පත්‍ර නිකුත් කිරීම, අවසර පත්‍ර අත්හිටවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා හේතු.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*("අවසර පත්‍රයෙහි විස්තර කර ඇති තත්ත්වයට වෙනස් තත්ත්වයක තේ අපනයනය කිරීම හෝ අපනයනය කිරීමට තැත් කිරීම හෝ තහනම් බව.)*

11. මේ වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබ සිටින කිසිම තැනැත්තකු විසින්, ඒ අවසර පත්‍රයෙහි විස්තර කර ඇති තත්ත්වයට වෙනස් තත්ත්වයක යම් තේ ප්‍රමාණයක් ඒ අවසර පත්‍රයේ බලය යටතේ අපනයනය කිරීම හෝ අපනයනය කිරීමට තැත් කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.".